පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂය - ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා

ජූලි තුන්වන සතිය

9 ශ්‍රේණිය

සැකසුම - ඩී.ඒ.ඒ.ඩී.අතුකෝරල මයා
ර/නිවි/ඇලපාත මහා විද්‍යා ලය

Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පාඩම - 1.2. කෘෂිකාර්මික ගැටළු සඳහා හරිත කෘෂි තාක්ෂණික විසඳුම් යොදා ගනිමු.**

**තාක්ෂණික ක්ෂේත්‍ර 1- කෘෂිකර්මය**

**නිපුණතාව - 2.4 ජෛව පරිසරය සුරැකීමට දායක වෙයි.**

**නිපුණතා මට්ටම - 2.4 පරිසර හිතකාමී බව රැක ගනිමින් කෘෂිකාර්මික කටයුතු පවත්වාගෙන යයි .**

**ගැඩවිල් පණුවන් යොදා ගනිමින් කාබනික පෝෂක ඒකකයක් සකසමු!**

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- සෙ.මී. 8-10 පමණ විෂ්කම්භයක් ඇති සෙ.මී. 40-50 පමණ උස PVC කැබැල්ලක් ගෙන මි.මී5 පමණ ප්‍ර මාණයේ සිදුරු සකස් කරන්න.
- එම නළය සකස් කර ගත් පාත්තිය තුළ ¾ක් පමණ වැසෙන සේ යට කරන්න.
- ඉන්පසු එය තුළට මාංශල ශාක කොටස් දමන්න. (කෙසෙල් කඳන් කැබලි, දිරන කොළ රොඩු, ශාක පත්‍රස, කෙසෙල් ලෙලි ආදී)
- ඉන්පසු එය මතට කළු පස් දමා ගැඩවිලුන් කිහිප දෙනෙකු (10-20) දමන්න.
- දින කිහිපයකින් එම ජෛව ස්කන්ධය ජීර්ණයෙන් ලැබෙන පෝෂක පාත්තියට ලැබෙනු ඇත.

**ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක**

- 9 ශ්‍රේණිය පෙළ පොත - ඒකකය 1.2 - පිටු අංක 38

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල**

- පරිසරය හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපවත්නා ගැටලු හඳුනා ගනියි.
- පාරිසරික ගැටලු අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග යෝජනා කරයි.
- කෘෂිකාර්මික කටයුතු මගින් හිතකර පරිසරයක් නිර්මාණය කළ හැකි කාර්යයන්හි නිරත වෙයි.